නිවේදනය

<u>සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.</u>

<u>සබරගමුව පළාතේ පළාත් සභා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2026/2027</u>

සබරගමුව පළාතේ පළාත් සභා පාසල්වල පවතින, උපලේඛන අංක I යටතේ දක්වා ඇති විෂය ක්ෂේත්‍රයන්ට (ප්‍රාථමික හා අ.පොස. (සාමාන්‍ය පෙළ) විෂයයන් සඳහා) අදාළ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අංක අමප/26/1789/806/094 හා 2026.09.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/CAD/SG හා 2026.10.26 දිනැති ලිපියෙන් ලද අනුමැතිය ප්‍රකාරව, අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2507/02 හා 2026.09.21 දිනැති ගැසට් නිවේදනය මඟින් සංශෝධනය කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 05 වන සංශෝධනයේ විධිවිධාන ප්‍රකාරව හා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/02/29/29/01/01 හා 2026.10.20 දිනැති ලිපියේ උපදෙස් ප්‍රකාරව සහ සබරගමුව පළාත් ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක GS/ES/7/6/2 හා 2026.11.06 දිනැති ලිපි මඟින් ලද අනුමැතිය ප්‍රකාරව, **විවෘත පදනම මත** මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති සබරගමුව පළාතේ ස්ථිර පදිංචි අධ්‍යාපනවේදී උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1). <u>සාමාන්‍ය සුදුසුකම් :-</u>

i. අයදුම්කරු / අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. විශිෂ්ට චරිතයකින් සහ මනා මානසික හා ශාරීරික සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

iii. සුදුසුකම් සලකා බලන දිනයට එනම්, 2026.11.09 දිනට පූර්වාසන්න වසර 03ක් සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (සම්මුඛ පරීක්ෂණයේදී තම පූර්වාසන්න වසර 03ට අදාළ ස්ථිර පදිංචිය, ග්‍රාම සේවා සහතික හෝ අදාළ වෙනත් ලියවිලි මගින් සනාථ කළ යුතු වේ.) එසේම, සුදුසුකම් සලකා බලන දිනයට පෙර විවාහ වී වෙනත් පළාතක සිට මෙම පළාතට පැමිණි අපේක්ෂකයින් වෙතොත්, ඔවුන් සිය විවාහ සහතිකය සහ කලත්‍රයාගේ ස්ථිර පදිංචි සහතිකය මඟින් පූර්වාසන්න වසර 03 ක ස්ථිර පදිංචිය සනාථ කළ යුතුය.

iv. 2026.11.09 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ වී තිබිය යුතු අතර, එදිනට වයස අවුරුදු 40 නොඉක්ම විය යුතුය.

v. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සලකා බලන දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

vi. සබරගමුව පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතුය.

2). <u>අධ්‍යාපන සුදුසුකම් :-</u>

i. අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2507/02 හා 2026.09.21 දිනැති ගැසට් නිවේදනය මඟින් සංශෝධනය කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 05 වන සංශෝධනයේ 13.8 හි විධිවිධාන ප්‍රකාරව 2026.11.09 දිනට විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවා ඇති හෝ වෙනත් විශේෂ පාර්ලිමේන්තු පනත් මඟින් පිහිටුවා ඇති උපාධි පිරිනමන ආයතන/ විශ්වවිද්‍යාල මඟින් ප්‍රදානය කරනු ලැබූ අධ්‍යාපනවේදී උපාධියක් ලබා තිබිය යුතු අතර, එම අධ්‍යාපනවේදී උපාධිය වසර 04ක පූර්ණකාලීන (මාර්ගගත නොවන) උපාධි පාඨමාලාවක් වීම හා අවම වශයෙන් සන්ධාර 120 (120 Credits) සම්පූර්ණ කර තිබීම, රජයේ ජාතික හෝ පළාත් පාසලක හෝ රජයේ අනුමත පෞද්ගලික පාසලක හෝ අවම වශයෙන් සති10ක ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව සම්පූර්ණ කර තිබීම හා එම පුහුණුව සුදුසුකම් සහිත අධීක්ෂණයක්/ අධීක්ෂණ මණ්ඩලයක් යටතේ සිදු කර තිබීම හා උපාධි පාඨමාලාව තුළ අවම වශයෙන් සන්ධාර 06ක් වත් සම්පූර්ණ කරන පර්යේෂණ නිබන්ධනයක්/ වාර්තාවක් සම්පූර්ණ කර තිබීම යන නිර්ණායකයන්ගෙන් සමන්විත වීම.

ii. එම උපාධියට හදාරා ඇති ප්‍රවීණතාවය ලද විෂයයට/ විෂයයන්ට අනුකූලව පුරප්පාඩු විෂය සඳහා මෙම නිවේදනයේ උපලේඛන අංක I හි සඳහන් සුදුසුකම් සපුරා තිබීම අනිවාර්යය වේ.

iii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය එක්වරකදී විෂයයන් 03ක් (සාමාන්‍ය ඉංග්‍රීසි හා පොදු පරීක්ෂණය හැර) සමත්වීම.

iv. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී මව්බස හා ගණිතය සමත්ව, සම්මාන 03ක් සහිතව විෂයයන් 06 කින් සමත්වීම.

ඉතා වැදගත් :- අයදුම්පත සම්පූර්ණ කිරීමේදී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගත යුතුය.

- ❖ ස්වකීය උපාධිය අනුව ඉල්ලුම් කළ හැකි විෂයය/ විෂයයන් හා මාධ්‍යය පිළිබඳව අයදුම්කරුවන් අවධානය යොමු කළ යුතුය.
- ❖ එහිදී ප්‍රවීණතාවය ලද විෂයය/ විෂයයන් හා මාධ්‍යය අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ යුතුය.
- ❖ ඉල්ලුම් කළ හැක්කේ උපරිම වශයෙන් විෂයයන් දෙකක් (02) සඳහා පමණි.
- ❖ පත්වීම් ලබා ගැනීමට ඇති කැමැත්තේ ප්‍රමුඛතාවය මත විෂයය/ විෂයයන් ඉල්ලුම් කළ යුතුය.
- ❖ ඔබ විසින් ඉල්ලුම් කළ විෂයය, මාධ්‍යය හා ප්‍රමුඛතාවය කිසිදු හේතුවක් මත පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ.
- ❖ පත්වීම් ලබා දීමේදී ඔබ විසින් ඉල්ලුම් කරන ලද කැමැත්තේ ප්‍රමුඛතාවය හා සබරගමුව පළාතේ ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ ප්‍රමුඛතාවය පිළිබඳව සලකනු ලැබේ.
- ❖ වසර 04ක පූර්ණකාලීන (මාර්ගගත නොවන) උපාධි පාඨමාලාවක් බවත්, උපාධි පාඨමාලාවේ අවම වශයෙන් සන්ධාර 120 (120 Credits) සම්පූර්ණ කර ඇති බවට හා උපාධි පාඨමාලාව තුළ අවම වශයෙන් සන්ධාර 06ක් වත් සම්පූර්ණ කරන පර්යේෂණ නිබන්ධනයක්/ වාර්තාවක් සම්පූර්ණ කර ඇති බවට විශ්වවිද්‍යාලය මඟින් නිකුත් කරන ලිපියක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.
- ❖ රජයේ ජාතික හෝ පළාත් පාසලක හෝ රජයේ අනුමත පෞද්ගලික පාසලක හෝ අවම වශයෙන් සති 10ක ප්‍රායෝගික ඉගැන්වීම් පුහුණුව සම්පූර්ණ කර තිබීම හා එම පුහුණුව සුදුසුකම් සහිත අධීක්ෂණයක්/ අධීක්ෂණ මණ්ඩලයක් යටතේ සිදු කර තිබෙන බව සනාථ කරන ලිපියක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.
- ❖ මේ සම්බන්ධයෙන් ඇතිවන ගැටලු හා ගුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ ප්‍රමුඛතාවය පිළිබඳව අවසන් තීරණය සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සතු වේ.

3). <u>බඳවා ගැනීමේ ක්‍රමය :-</u>

3:1. අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.3.5 වගන්තිය ප්‍රකාරව හා අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2507/02 හා 2026.09.21 දිනැති ගැසට් නිවේදනය මඟින් සංශෝධනය කරන ලද අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 05 වන සංශෝධනයේ විධිවිධාන ප්‍රකාරව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

3.2 සුදුස්සන් තෝරා ගැනීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් සහ ප්‍රායෝගික පරීක්ෂණයක් පැවැත්වේ.

3:3. **<u>සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :-</u>** ගුරු සේවයට බඳවා ගැනීම සඳහා වන මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීමට සහ කායික හා මානසික යෝග්‍යතාව පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දීමක් සිදුකරනු නො ලැබේ.

3:4. **<u>ප්‍රායෝගික පරීක්ෂණය :-</u>** ගුරු වෘත්තියේදී වැදගත් වන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ අයදුම්කරු සතු කුසලතාව මැන බැලීම මෙහිදී සිදු කරනු ලැබේ. අයදුම්කරුවන් විසින් පත්වීම් ලබා ගැනීමට අපේක්ෂා කරන විෂයයට අදාළව හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ විනාඩි 05කට නොඅඩු ඉදිරිපත් කිරීමක් ප්‍රායෝගික පරීක්ෂණ අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතුය. ප්‍රායෝගික පරීක්ෂණයේ දී පහත සඳහන් නිර්ණායක ඔස්සේ ලකුණු ලබා දෙනු ඇත.

අනු අංකය	ප්‍රායෝගික පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක	උපරිම ලකුණු ප්‍රමාණය	සමත් වීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය
1.	අරමුණ හා ප්‍රවිෂ්ට වීම.	05	02
2.	පෞරුෂය හා හඬ පාලනය.	05	02
3.	සන්නිවේදනයේ පැහැදිලි බව.	05	02
4.	කාල කළමනාකරණය.	05	02
5.	ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය.	05	02
	මුළු ලකුණු ප්‍රමාණය.	25	10

3:5. ඒ අනුව, සබරගමුව පළාතේ පළාත් සභා පාසල්වල පවතින, මෙම නිවේදනයේ අවසානයට දක්වා ඇති උප ලේඛන අංක I හි සඳහන් පුරප්පාඩු විෂයයන් සඳහා පමණක් මෙම බඳවා ගැනීම් සිදුකරනු ඇත.

3:6. පත්වීම් ලබාදීම සිදුකරනු ලබන්නේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට අදාළව ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගන්නා ලද මුළු ලකුණුවල ප්‍රමුඛතාව අනුව වන අතර, සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීම පත්වීමක් ලබා ගැනීම සඳහා වන සුදුසුකමක් සේ සලකනු නොලැබේ.

3:7. සම්මුඛ පරීක්ෂණය සඳහා නියමිත දිනයේදී සහභාගී නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු අතර, පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් භාරගනු නොලැබේ.

4). <u>සේවා කොන්දේසි :-</u>

4:1. රජයේ / පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලටද යටත්ව තෝරා ගනු ලබන අධ්‍යාපනවේදී උපාධිධාරීන් සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට පත් කරනු ලැබේ.

4:2. මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තවද, ඔබ වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මඟින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

4:3. මෙම තනතුරට පත්කරනු ලබන්නන් වසර 03ක පරිවාස කාලයකට යටත් වේ.

4:4. අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.3.5 වගන්තිය ප්‍රකාරව හා අතිවිශේෂ ගැසට් පත්‍ර අංක 2507/02 හා 2026.09.21 දිනැති ගැසට් නිවේදනය මඟින් සංශෝධනය කරන ලද අංක 1885/38 හා 2014.10.23 දිනැති ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථාවේ 05 වන සංශෝධනයේ විධිවිධාන ප්‍රකාරව බඳවා ගැනීම් සිදුකරනු ලබන අතර, උසස්වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව සිදුකරනු ඇත. එමෙන්ම මෙම නිවේදනයෙන් ආවරණය නොවන්නාවූ යම් කරුණක් වෙතොත් එම අවස්ථා ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ සඳහන් විධිවිධානවලට යටත්වනු ඇත.

4:5. සෑම පත්වීම්ලාභියෙකුම 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 18/2020හි සඳහන් විධිවිධාන අනුව හා එයට වරින් වර සිදුකරනු ලබන සංශෝධනයන්ට අනුව දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතුය.

4:6. මෙම බඳවා ගැනීම පාසල් පාදකව සිදුකෙරෙන බැවින් සෑම අයෙකුම මුල් පත්වීම ලබන පාසලේ අවම වශයෙන් අඛණ්ඩව වසර 05ක් අනිවාර්යයෙන්ම සේවය කළ යුතු අතර, එම කාල සීමාව තුළදී ස්ථාන මාරු හිමිකම් නොලැබේ.

5). <u>වැටුප් පරිමාණය :-</u>

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව වන අතර, මෙම පත්වීමට හිමි වැටුප් ක්‍රමය ජීඊ-2-2025 දරන වැටුප් ඛණ්ඩය යටතේ මාසිකව **රු.66,880-10x1490-7x2400-20x2940-රු.157,380/= ක්** වේ. අධ්‍යාපනවේදී උපාධිධාරීන් මෙම වැටුප් පරිමාණයේ 3 වන පියවර වන රු 69,860/- මාසික වැටුප මත පිහිටවනු ලැබේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනාවන් ද හිමි ය.

6). <u>අයදුම්පත පිරවීම සඳහා උපදෙස් :-</u>

6:1. අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ කැඳවනු ලැබේ.

6:2. සියළුම සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් www.moe.sg.gov.lk යන අපගේ නිල වෙබ් අඩවියට පිවිස මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනය බාගත කර ගත හැකිය.

6:3. සියළුම සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් අදාළ තොරතුරු ඇතුළත් කරමින් අයදුම්පත මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ සම්පූර්ණ කළ යුතුය.

6:4. එක් අයදුම්කරුවෙකුහට ප්‍රවීණතාවය ලද විෂයය/ විෂයයන් හා මාධ්‍යය අනුව උපරිම වශයෙන් විෂයයන් දෙකක් (02) සඳහා පමණක් ඉල්ලුම් කිරීමට හැකියාව ඇත.

6:5. අයදුම්පත සම්පූර්ණ කිරීමේදී උපලේඛන අංක I භාවිතා කරන්න.

6:6. අයදුම්පත පිරවීමේදී විශේෂිත අක්ෂර (Special Characters) නොයෙදිය යුතුය.

6:7. සම්පූර්ණ කරන ලද තොරතුරු නිවැරදිව හා දී ඇති උපදෙස් පරිදි සම්පූර්ණ කර තිබේදැයි අයදුම්පත යොමු කිරීමට (Submit) පෙර තහවුරු කර ගත යුතුය. පසුව කිසිදු අයුරකින් ඔබ විසින් ඇතුළත් කරන ලද තොරතුරු වෙනස් කිරීමට අවස්ථාව දෙනු නොලැබේ.

6:8. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ.

6:9. අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7). <u>අයදුම් කිරීමේ ක්‍රමය :-</u>

7:1. සියළුම සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් www.moe.sg.gov.lk යන අපගේ නිල වෙබ් අඩවියට පිවිස "බඳවා ගැනීම් හා ස්ථාන මාරු" යටතේ ඇති "පළාත් ගුරු සේවය" ඔස්සේ "**සබරගමුව පළාතේ පළාත් සභා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2026/2027"** යටතේ පළ කර ඇති නිවේදනය කියවා අයදුම්පත මාර්ගගතව සම්පූර්ණ කළ යුතුය.

7:2. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අංක 08, 09 කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ ඊට පෙර **"ලේකම්, අධ්‍යාපන, තොරතුරු හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, සබරගමුව පළාත් සභාව, නව නගරය, රත්නපුර"** යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාතේ පළාත් සභා පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සඳහා අධ්‍යාපනවේදී උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2026/2027"** යනුවෙන් අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය. අයදුම්පත සමඟ කිසිදු සහතිකයක් අමුණා නොඑවිය යුතුය.

7:3. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සමාදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු / නීතිඥවරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු / ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු / පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු / රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබිය යුතුය.

7:4. එක් අයදුම්කරුවෙකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි. අයදුම්පත් ලැබී ඇති බව අයදුම්කරුවන් වෙත දන්වනු නොලැබේ. ඉල්ලුම් කරන ලද විෂයය/ විෂයයන් පසු අවස්ථාවක දී කිසිසේත් වෙනස් කරනු නොලබන අතර, ඒ පිළිබඳව ඉදිරිපත් කරන අභියාචනා සලකා බලනු නොලැබේ. තවද, උපාධියට හදාරා ඇති ප්‍රවීණතාවය ලද විෂයය/ විෂයයන් යටතේ උපලේඛන අංක I හි සඳහන් සුදුසුකම් අනුව පමණක් ඉල්ලුම් කළ යුතු අතර, පත්කරනු ලබන පාසල හෝ පත්වීම් විෂයය කිසිදු හේතුවක් මත වෙනස් කරනු නොලැබේ.

7:5. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 නොවැම්බර් මස 09 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 දෙසැම්බර් මස 09 වැනි දින ප.ව. 09.00ට** අවසන් වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර, මුද්‍රිත පිටපතෙහි අංක 08, 09 කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර ගැනීමෙන් අනතුරුව **2026.12.14 දින හෝ ඊට පෙර** ලැබෙන සේ උක්ත අංක 7:2.හි සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

7:6. අයදුම්පත තැපෑලේදී නැති වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසන් දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදු විය හැකි පාඩුව අයදුම්කරුවන් විසින් විඳදරා ගත යුතුය.

08). ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දින හෝ එදිනට පෙර නියමිත පරිදි අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ඇත. සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගීවීමට අවස්ථාව ලැබීම සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් වශයෙන් නොසැලකිය යුතුය.

09). කිසියම් අයදුම්කරුවෙකු සුදුසුකම් සපුරා නොමැති බව පත්වීම් ලැබීමට පෙර අනාවරණය වුවහොත් ඔහුගේ / ඇයගේ අයදුම්පත කිසිදු හේතුවක් නොදන්වා ප්‍රතික්ෂේප කරනු ලැබේ. තවද නියමිත සුදුසුකම් පිළිබඳව දැන දැනම හෝ ඕනෑකමින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව හෝ නිරවද්‍ය තොරතුරු යටපත් කර ඇති බව හෝ පත්වීම් ලැබීමෙන් පසු අනාවරණය වුවහොත් හෝ පත්කිරීම සඳහා නුසුදුසු බව හෝ අනාවරණය වුවහොත්, වහාම රජයේ සේවයෙන් පහ කරනු / සේවය අවසන් කරනු ලැබේ.

10). උපලේඛන අංක I හි දක්වා ඇති විෂයය ක්ෂේත්‍රයන්ට අදාළව පමණක් මෙම නිවේදනය මගින් අයදුම්පත් කැඳවා ඇති අතර, එබැවින් මෙම නිවේදනයට අදාළව අයදුම්පතක් ඉදිරිපත් කිරීම, සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම හෝ ඊට ඉදිරිපත් වීම යන කිසිදු කරුණක් හෝ වෙනයම් ඕනෑම කරුණක් සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවයේ පත්වීමක් ලබා ගැනීම සඳහා වන අයිතිවාසිකමක් හෝ නීත්‍යානුකූල හිමිකමක් නොවන්නේ ය.

11). මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය ද සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සතු වන්නේ ය. එසේම, මෙම බඳවා ගැනීම කල්දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/ නොගැනීම පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය ද සබරගමුව පළාත් අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සතු වන්නේ ය.

12). සිංහල හා දෙමළ භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍යය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

ජී.ඩී. ලක්මලී යූ. කුමාරි
ලේකම්,
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත.

2026.11.09 වන දින,
සබරගමුව පළාත් සභාවේ,
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේදී ය.

උපලේඛන අංක I

පුරප්පාඩු විෂය	අධ්‍යාපන සුදුසුකම්	පුරප්පාඩු පවතින මාධ්‍ය හා විෂය කේත අංකය		
		සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	ඉංග්‍රීසි මාධ්‍යය
ප්‍රාථමික අධ්‍යාපනය	අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ මව් භාෂාව ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**10S**	**10T**	
විද්‍යාව	අදාළ විෂය අ.පො.ස. (උසස් පෙළ) විෂයක් ලෙස / විෂය ධාරාව ලෙස හදාරා ඉන් සමත් වී තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**11S**	**11T**	
ගණිතය	අදාළ විෂය අ.පො.ස. (උසස් පෙළ) විෂයක් ලෙස / විෂය ධාරාව ලෙස හදාරා ඉන් සමත් වී තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**12S**		
සිංහල භාෂාව හා සාහිත්‍යය	අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**13S**		
දෙමළ භාෂාව හා සාහිත්‍යය	අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම		**14T**	
ඉංග්‍රීසි භාෂාව	අදාළ විෂය අ.පො.ස. (උසස් පෙළ) විෂයක් ලෙස හදාරා ඉන් සමත් වී තිබීම හෝ උසස් පෙළ සාමාන්‍ය ඉංග්‍රීසි විෂය සම්මාන සාමාර්ථයක් හෝ ඊට ඉහළ සාමාර්ථයක් සහිතව සමත් වීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**15S**		
ඉතිහාසය	අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**16S**	**16T**	
බුද්ධ ධර්මය	අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස බුද්ධ ධර්මය හෝ බෞද්ධ ශිෂ්ටාචාරය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**17S**		

උපලේඛන අංක I

පුරප්පාඩු විෂය	අධ්‍යාපන සුදුසුකම්	පුරප්පාඩු පවතින මාධ්‍ය හා විෂය කේත අංකය		
		සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	ඉංග්‍රීසි මාධ්‍යය
භූගෝල විද්‍යාව	අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**18S**	**18T**	**18E**
පුරවැසි අධ්‍යාපනය	අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස දේශපාලන විද්‍යාව හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**19S**	**19T**	
සංගීතය (පෙරදිග)	අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**20S**		
නැටුම් (දේශීය)	අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**21S**		
චිත්‍ර	අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**22S**		
නාට්‍ය හා රංග කලාව	අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**23S**		
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය	අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**24S**	**24T**	**24E**
කෘෂි හා ආහාර තාක්ෂණය	අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**25S**		**25E**
සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය	අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**26S**		
විශේෂ අධ්‍යාපනය	අධ්‍යාපනවේදී උපාධිය සමත්වීම සහ අධ්‍යාපනවේදී උපාධිය තුළ ප්‍රධාන විෂයය / විෂයයන් ලෙස අදාළ විෂය හදාරා තිබීම හා අධ්‍යාපනවේදී උපාධිය තුළ ගුරු පුහුණුව ලබා තිබීම	**27S**		